සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

27.02.2024

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

Learning Resource Centre
R
De Mazenod College
Kandana
51819

වර්ෂ අවසාන ඇගයීම - 2023 (2024)
ஆண்டிறுதி மதிப்பீடு - 2023 (2024)
Year End Evaluation - 2023 (2024)

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂයය / பாடம் / Subject: බුද්ධ ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper: I, II | කාලය / காலம் / Time: පැය 3 යි |

නම / பெயர் / Name ..........................................  විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ..........................

I කොටස

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1,2,3,4 යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.
- එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා ඒවා ද පිළිපදින්න.

01. බුදුරජාණන් වහන්සේගේ අසරණ සරණ ගුණය ප්‍රකටවන නිදර්ශන චරිත දෙකක් ඇතුළත් වරණය තෝරන්න.
   1. මට්ටකුණ්ඩලී හා අංගුලිමාල
   2. අංගුලිමාල හා ඡත්තමානවක
   3. ඡත්තමානවක හා මට්ටකුණ්ඩලී
   4. ඡත්තමානවක හා ආලවක යක්ෂයා

02. සිදුහත් බෝසතාණන් වහන්සේගේ රූපශ්‍රීය දැක "මෙවන් පුතෙකු ලද මවත් පියත් නිවුණෝ වෙති" යනාදි වශයෙන් ප්‍රකාශ කරනු ලැබුයේ,
   1. විශාඛා සිටු දේවියයි.
   2. කිසාගෝතමී දේවියයි.
   3. ජනපද කල්‍යාණී කුමරියයි.
   4. මාගන්දියා බැමිණියයි.

03. "ඇවැත්නි, ශෝක නොකරව්, නොවැළපෙව්, අපි ඒ මහා ශ්‍රමණයාගෙන් මැනවින් මිදුණෝ වෙමු" යනුවෙන් ප්‍රකාශ කරනු ලැබුයේ,
   1. ඡන්න භික්ෂුව විසිනි.
   2. සුදින්න භික්ෂුව විසිනි.
   3. සුභද්‍ර භික්ෂුව විසිනි.
   4. දේවදත්ත භික්ෂුව විසිනි.

04. තමන් වහන්සේ අවබෝධ කරගත් ධර්මය පළමුව දේශනා කිරීම සඳහා බුදුරජාණන් වහන්සේ වැඩම කළේ,
   1. උරුවෙල් ජනපදයට ය.
   2. කිඹුල්වත්පුර නුවරට ය.
   3. බරණැස ඉසිපතන මිගදායට ය.
   4. සේනානි නියම්ගමට ය.

05. භාවනා කමටහන් ලැබිය යුතු චරිත ලක්ෂණ අතර තර්කානුකූල විමසුම් සිතින් කටයුතු කරන චරිතය වන්නේ,
   1. මෝහ චරිතයයි.
   2. ශ්‍රද්ධා චරිතයයි.
   3. බුද්ධි චරිතයයි.
   4. විතර්ක චරිතයයි.

06. සිල් රැකීමෙන් ලැබෙන අනුසස් පහක් බුද්ධ දේශනාවේ සඳහන් වේ. ඉන් එකක් වන්නේ,
   1. අනුවණයින් ඇසුරට ලැබෙයි.
   2. ගින්නෙන් අනතුරු සිදු නොවෙයි.
   3. නීවරණ ධර්ම නැතිවෙයි.
   4. මරණින් මතු සුගතියේ උපදියි.

07. සිදුහත් කුමරු උපන් මොහොතේ සිදුවූ අසිරිමත් සිදුවීමක් ඇතුළත් පිළිතුර තෝරන්න.
1. සත් පියුම් මත පියවර තබා ඇවිදීම.
2. පිය රජතුමා පළමුවර වැඳීම.
3. මෑණියන් මියගොස් දෙව්ලොව ඉපදීම.
4. පෙරනිමිති සතරක් දැකීම.

08. මිනිස් සමාජයේ සහජීවනය හෙවත් සාමය හා සමගිය ඇතිවීමට සෘජුව ම උපකාරවන ඉගැන්වීමක් වන්නේ,
1. දසරාජ ධර්මයයි.
2. සතර සංග්‍රහ වස්තුවයි.
3. ත්‍රිලක්ෂණ භාවනාවයි.
4. සේඛියා ධර්මයි.

09. බුදු සසුන නගා සිටුවීමට කරන ලද සුවිශාල මෙහෙවරට උපහාර පිණිස කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා විසින් සංඝරාජ පදවියෙන් පුදනු ලැබූ ස්වාමීන් වහන්සේ කවුරුන් ද?
1. රේරුකානේ චන්ද්‍රවිමල හිමියන් ය.
2. සියම් දේශයේ උපාලි හිමියන් ය.
3. වැලිවිට සරණංකර හිමියන් ය.
4. හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමියන් ය.

10. "රහසත් පව් නොකොට - කෙලෙසරයනුත් දුරුකොට" යනාදි වශයෙන් කියැවෙන මෙම කවියේ සඳහන්වන බුදු ගුණය කුමක් ද?
1. අරහං බුදු ගුණයයි.
2. සම්මා සම්බුද්ධ බුදු ගුණයයි.
3. සුගත බුදු ගුණයයි.
4. ලෝකවිදූ බුදු ගුණයයි.

11. පංචස්කන්ධ විග්‍රහයට අනුව අප විසින් පංචේන්ද්‍රියන් තුළින් අරමුණු හඳුනාගෙන රැස්කරන දේ හැඳින්වෙන්නේ,
1. වේදනා යනුවෙනි.
2. සඤ්ඤා යනුවෙනි.
3. සංඛාර යනුවෙනි.
4. විඤ්ඤාණ යනුවෙනි.

12. "සිංහලයිනි නැගිටිවූ, බුද්ධගයාව බේරා ගනිව්" යන්න ආදර්ශ කරගෙන දඹදිව බෞද්ධ සිද්ධස්ථාන බෞද්ධයන්ට උරුම කර දීමට කටයුතු කළේ කවුරුන් ද?
1. ඕල්කට් තුමා ය.
2. දොන් කරෝලිස් හේවාවිතාරණ මහතා ය.
3. දුටුගැමුණු රජතුමා ය.
4. අනගාරික ධර්මපාලතුමා ය.

13. බෞද්ධ ඉගැන්වීම්වල සඳහන් ආහාර ගිජු ලෙස ගිලදමන පුද්ගලයන් අතර අනුභව කළ ආහාර වමාරා දමා නැවතත් ආහාර ගන්නා පුද්ගලයා හඳුන්වා ඇත්තේ,
1. ආහාර හත්ථක නමින් ය.
2. අලංසාටක නමින් ය.
3. කාකමාසක නමින් ය.
4. භුත්තවම්තක නමින් ය.

14. ස්වාභාවික පරිසරයට ඇලුම් කළ බුදුරජාණන් වහන්සේ විශාලා මහනුවර කූටාගාර ලෙනෙහි ගතකර ඇත්තේ,
1. පළමුවන වස්කාලයයි.
2. පස්වන වස්කාලයයි.
3. අටවන වස්කාලයයි.
4. දොළොස්වන වස්කාලයයි.

15. යහපත් ක්‍රියාවල යෙදවීම, යහපත් හිතින් අනුකම්පා කිරීම, අසා නොමැති දේ කියාදීම යන යුතුකම් ඉටුකළ යුත්තේ,
1. පැවිදි උතුමන් විසින් ගිහියාට ය.
2. ගුරුවරයා විසින් ශිෂ්‍යයාට ය.
3. දෙමාපියන් විසින් දරුවන්ට ය.
4. මිතුරා විසින් මිතුරන්ට ය.

16. බුද්දක නිකායට අයත් ධම්මපදයේ ඇතුළත් ගාථා ප්‍රමාණය හා නිදාන කතා ප්‍රමාණය පිළිවෙළින් ඇතුළත් වරණය තෝරන්න.
1. ගාථා 299 කි. නිදාන කතා 423 කි.
2. ගාථා 423 කි. නිදාන කතා 423 කි.
3. ගාථා 299 කි. නිදාන කතා 299 කි.
4. ගාථා 423 කි. නිදාන කතා 299 කි.

17. පාලි භාෂාව නොදත් සාමාන්‍ය ජනයාට උපදේශ සැපයීම අරමුණු කරගෙන කෝට්ටේ යුගයේ විසූ වීදාගම මහා මෛත්‍රේය හිමියන් විසින් රචිත කවි බණ පොත කුමක් ද?
1. බුදුගුණ අලංකාරයයි.
2. කාව්‍යශේඛරයයි.
3. ලෝවැඩ සඟරාවයි.
4. සැළලිහිණි සංදේශයයි.

18. "මහණෙනි, ඔබට දැන් මවක නැත. පියෙකු නැත. එහෙයින් මෙබඳු අවස්ථාවක දී එකිනෙකා ඔවුනොවුන්ට උපකාරී ව සහයෝගයෙන් ක්‍රියා කළ යුතු ය." බුදුරජාණන් වහන්සේ මෙසේ වදාළේ,
1. පූතිගත්ත තිස්ස හිමියන් මුල් කරගෙන ය.
2. මුගලන් තෙරුන් මුල් කරගෙන ය.
3. ගිරිමානන්ද තෙරුන් මුල් කරගෙන ය.
4. උදරාබාධයකින් පෙළුණු භික්ෂුවක් මුල් කරගෙන ය.

19. බුදුරජාණන් වහන්සේ කසීභාරද්වාජ බමුණාට කසීභාරද්වාජ සූත්‍රය දේශනා කළේ,

1. ඇටවෙරියා වනයක දී ය.
2. කෙත් යායක දී ය.
3. ජීවක අඹ උයනේ දී ය.
4. ගග්ගරා පොකුණ අසල දී ය.

20. සීලයෙන් යුතුව සමාධි භාවනාවට යොමුවන පුද්ගලයෙකු තුළ තිබිය යුතු ගුණයක් වන "සන්තුට්ඨිතා" යන්නෙන් අදහස් වන්නේ,

1. ලද දෙයින් සතුටු වීමයි.
2. ඉන්ද්‍රියන් සංවර කර ගැනීමයි.
3. සිහියෙන් කටයුතු කිරීමයි.
4. අල්පේච්ඡව ජීවත් වීමයි.

21. පසිඳුරන් පිනවීමට දවසේ වැඩි කාලයක් ගත නොකොට රට හා රට වැසියන් වෙනුවෙන් කළ යුතු යුතුකම් දසරාජ ධර්මවල හඳුන්වා ඇත්තේ

1. ඍජු බව නමින් ය
2. මෘදු බව නමින් ය.
3. තපස නමින් ය.
4. අක්‍රෝධය නමින් ය.

22. දඹදෙණි යුගයේ රජකම් කළ දෙවන පරාක්‍රමබාහු නිරිඳුන් විසින් රචනා කරනු ලැබූ සිංහලයේ මහා කාව්‍යය ලෙස සැලකෙන "කව්සිළුමිණ" කෘතියට පාදක වූ ජාතක කතාව කුමක් ද?

1. මඛාදේව ජාතකයයි.
2. මහා කපි ජාතකයයි.
3. සස ජාතකයයි
4. කුස ජාතකයයි.

23. බුදුරජාණන් වහන්සේ වදාළ පරිදි භික්ෂූන් වහන්සේලා දානය වැළඳිය යුත්තේ,

1. ශරීරය ලස්සන කරගනු පිණිස ය.
2. පිළිවෙත් පිරීමට උපකාර වනු පිණිස ය.
3. සැතපීමට පහසුවක් වනු පිණිස ය.
4. දායකයන් පිළිගන්වන නිසා ය.

24. චූල්ලකම්ම විභංග සූත්‍රයේ ඉගැන්වෙන ආකාරයට කුසල් අකුසල් පිළිබඳව හා සත්‍ය අසත්‍ය පිළිබඳව විමසමින් ජීවත්වන පුද්ගලයා මතු භවයන්හි,

1. උසස් කුලයන්හි උපදියි
2. මහේශාක්‍ය ව උපදියි.
3. ප්‍රඥාවන්ත ව උපදියි.
4. රූමත් ව උපදියි.

25. මෛත්‍රී භාවනාවේ යෙදීමෙන් හා කල්‍යාණ මිතුරන් ඇසුරු කිරීමෙන් දුරුකර ගත හැකි නීවරණ ධර්මය කුමක් ද?

1. කාමච්ඡන්ද නීවරණය යි.
2. ව්‍යාපාද නීවරණය යි.
3. ථීනමිද්ධ නීවරණය යි.
4. විචිකිච්ඡා නීවරණය යි.

26. නිදහස්ව සිතාමතා කරුණු විමසා බලා යමක් පිළිගැනීමට හෝ ප්‍රතික්ෂේප කිරීමට උපදෙස් දෙමින් බුදුරජාණන් වහන්සේ දේශනා කළ සූත්‍ර දේශනාව කුමක් ද?

1. සිගාලෝවාද සූත්‍රයයි.
2. ව්‍යග්ඝපජ්ජ සූත්‍රයයි.
3. දම්සක්පැවතුම් සූත්‍රයයි.
4. කාලාම සූත්‍රයයි.

27. සැරියුත් හා මුගලන් මහරහතන් වහන්සේලා දෙනම බුදු සසුනේ පැවිදිවීමට පෙර පැවිදිව සිටියේ,

1. ආලාරකාලාම තවුසා ඇසුරේ ය.
2. සංජය පරිබ්‍රාජකයා ඇසුරේ ය.
3. උද්දකරාම තවුසා ඇසුරේ ය.
4. සුප්පිය පරිබ්‍රාජකයා ඇසුරේ ය.

28. පමණ දැන ආහාර අනුභවය පිළිබඳව බුදුරජාණන් වහන්සේගෙන් උපදෙස් ලැබූ රජතුමා වන්නේ,

1. බිම්බිසාර රජතුමා ය
2. සුද්ධෝදන රජතුමා ය.
3. කොසොල් රජතුමා ය.
4. අජාසත්ත රජතුමා ය.

29. තිවන් පසක් කිරීමට අවශ්‍ය මනා වූ පිළිවෙත් පුරණ බැවින් මහා සංඝරත්නය,

1. සුපටිපන්න ගුණයෙන් යුක්ත ය.
2. උජුපටිපන්න ගුණයෙන් යුක්ත ය.
3. ආහුනෙය්‍ය ගුණයෙන් යුක්ත ය.
4. පාහුනෙය්‍ය ගුණයෙන් යුක්ත ය.

30. අකුසලය ද අකුසල මූලය ද, කුසලය ද කුසල මූලය ද, අකුසලය ද අකුසල විපාකය ද කුසලය ද කුසල විපාකය ද, දැන දැක ගන්නා ඥානය ආර්ය අෂ්ටාංගික මාර්ගයේ ඉගැන්වෙන්නේ,

1. සම්මා දිට්ඨි යනුවෙනි.
2. සම්මා සංකප්ප යනුවෙනි.
3. සම්මා වායාම යනුවෙනි.
4. සම්මා සමාධි යනුවෙනි.

31. "උට්ඨානවතෝ සතිමතෝ..." යනාදී ධම්මපද ගාථාවෙහි දැක්වෙන ගුණධර්ම අතර සිත, කය හා වචනය සංවර කරගෙන ගුණ ධර්මයෙහි පිහිටා කටයුතු කිරීම,

1. නිසම්මකාරී නම් වේ.
2. සඤ්ඤත නම් වේ.
3. ධම්මජීවි නම් වේ.
4. අප්පමත්ත නම් වේ.

32. දාගැබක සීනුවක හැඩයෙන් යුක්ත ගර්භයක් දක්නට ලැබෙන්නේ නම් එම දාගැබ,

1. ඝණ්ටාකාර දාගැබකි.
2. ඝටාකාර දාගැබකි.
3. බුබ්බුලාකාර දාගැබකි.
4. ධාන්‍යාකාර දාගැබකි.

33. ත්‍රිපිටකය මුඛ පරම්පරාවෙන් රැකගෙන ඉදිරියට රැගෙන යාමට භාණක පරම්පරාවන්ට භාරවුණි. ඒ අනුව සූත්‍ර පිටකයට අයත් ඛුද්දක නිකාය පැවරුණේ,

1. ආනන්ද තෙරුන්ගේ ශිෂ්‍යානුශිෂ්‍ය පරපුරට ය.
2. සැරියුත් තෙරුන්ගේ ශිෂ්‍යානුශිෂ්‍ය පරපුරට ය.
3. අනුරුද්ධ තෙරුන්ගේ ශිෂ්‍යානුශිෂ්‍ය පරපුරට ය.
4. සියලු ම තෙරුන්ට ය.

34. ගුරුතුමාට සවන් දීමෙන්, පොතපත කියවීමෙන් නුවණ (ප්‍රඥාව) දියුණු කිරීම හැඳින්වෙන්නේ,

1. චින්තාමය පඤ්ඤා යනුවෙනි.
2. සුතමය පඤ්ඤා යනුවෙනි
3. භාවනාමය පඤ්ඤා යනුවෙනි
4. ලෞකික පඤ්ඤා යනුවෙනි.

35. සදෙව් ලොව හා මිනිස් ලොව වැනි සැපවත් තැන්වල ඉපදීමට ඉවහල් වන කර්ම ප්‍රභේදය වන්නේ,

1. ජනක කුසල කර්මයයි.
2. උපත්ථම්භක කුසල කර්මය යි.
3. උපපීඩක කුසල කර්මය යි.
4. උපඝාතක කුසල කර්මය යි.

36. 1897 ජූලි මස 19 දින උපන් රුබෙල් ගුණවර්ධන කුමරුවා 1906 ජනවාරි 8 වනදා පැවිදි විය. පැවිදි වීමෙන් පසු හැඳින්වූයේ,

1. වැලිවිට සරණංකර හිමි නමින් ය.
2. සිරි දේවමිත්ත ධර්මපාල හිමි නමින් ය.
3. රේරුකානේ චන්ද්‍රවිමල හිමි නමින් ය.
4. මොහොට්ටිවත්තේ ගුණානන්ද හිමි නමින් ය.

37. මහා මංගල සූත්‍රයේ සඳහන් මංගල කරුණු තිස් අටෙන් (38) වැඩි ප්‍රමාණයක් අදාළ වන්නේ පුද්ගලයාගේ,

1. මෙලොව දියුණුව සඳහා ය.
2. පරලොව දියුණුව සඳහා ය.
3. දෙව්ලොව දියුණුව සඳහා ය.
4. පැවිදි ජීවිතයේ දියුණුව සඳහා ය.

38. "මහණෙනි, දුප්පතුන්ට ධනය නූපදනා කල දිළිඳුකම වැඩි වේ..." යනාදි වශයෙන් හේතුඵල දහම අනුව සමාජ ගැටලු ඇතිවන ආකාරය පැහැදිලි කර ඇති සූත්‍ර දේශනාව කුමක් ද?

1. මහා සීහනාද සූත්‍රය යි.
2. පත්තකම්ම සූත්‍රය යි.
3. භද්දාලි සූත්‍රය යි.
4. චක්කවත්ති සීහනාද සූත්‍රය යි.

39. පුරාවිද්‍යාඥයින්ට අනුව මෙරට කලාත්මක බවින් උසස් ම බෝධිඝරය හමුවන්නේ,

1. තොළුවිල ප්‍රදේශයෙනි.
2. කුරුණෑගල නිල්ලක්ගම ප්‍රදේශයෙනි.
3. අනුරාධපුර ඇතුළු නුවරිනි.
4. පොළොන්නරුව මැදිරිගිරියෙනි.

40. යහපතට යෙදූ විට මව්පියන් කරන යහපතට වඩා යහපතක් සිදු කරන, අයහපතට යෙදූ විට සතුරකු කරන අයහපතට වඩා අයහපතක් සිදු කරන එකම සාධකය ලෙස බුදු දහමේ දක්වෙන්නේ,

1. සිත ය.
2. කය ය.
3. වචනය ය.
4. බුද්ධිය ය.

51848

## II කොටස

සැලකිය යුතුයි.

- පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.

01.) 01. බුදු දහමේ ඉගැන්වෙන ප්‍රධාන භාවනා ප්‍රභේද දෙක නම් කරන්න.

02. ඉරියව් අනුව බුද්ධ ප්‍රතිමා වර්ග දෙකක් නම් කරන්න.

03. සතර පෙරනිමිතිවලින් දෙකක් ලියා දක්වන්න.

04. සේඛියා ධර්මවලට අනුව ආහාර පරිභෝජනයේදී අප පිළිපැදිය යුතු යහපත් පුරුදු දෙකක් ලියන්න.

05. දෙවන ධර්ම සංගායනාව පැවැත්වීමට බලපෑ ප්‍රධාන හේතුව කුමක් ද? එම ධර්ම සංගායනාව පැවැත්වූයේ සම්බුද්ධ පරිනිර්වාණයෙන් වසර කීයකට පසුව ද?

06. මහා මංගල සූත්‍රයේ සඳහන් මංගල කරුණු දෙකක් ලියන්න.

07. ''ඉමස්මිං අසති ඉදං න හෝති -. ඉමස්ස නිරෝධා ඉදං නිරුජ්ඣති'' මෙම පාලි පාඨයේ තේරුම ලියන්න.

08. ගිහියාගේ ප්‍රතිපදා මාර්ගයක් වන ගෘහස්ථ සීලයට අයත් සිල්පද දෙකක් ලියන්න.

09. බුදුරජාණන් වහන්සේ ලොව පහළ වන විට භාරතයේ පැවති ප්‍රධාන විමුක්ති මාර්ග දෙක කුමක් ද?

10. සූත්‍ර පිටකයට අයත් කොටස් පහෙන් දෙකක් නම් කරන්න.

(ලකුණු 2×10 = 20)

02.) 01. සිගාලෝවාද සූත්‍රයේ සඳහන් යට දිසාවට හා උඩ දිසාවට අයත් සමාජ කණ්ඩායම් මොනවා ද?

02. එම සූත්‍රයේ සඳහන් ශිෂ්‍යයාගෙන් ගුරුවරයාට ඉටුවිය යුතු යුතුකම් තුනක් ලියන්න.

03. පාසල් අධ්‍යාපන කටයුතු මැනවින් කරගෙන යාම, ඔබේ අනාගත ජීවිතය සාර්ථක කර ගැනීමට ඉවහල් වන අයුරු පෙන්වා දෙන්න. (ලකුණු 2+3+5 = 10)

03.) ධර්මධර විනයධර මහතෙරවරුන් රැස්ව ශාසනාභිවෘද්ධිය අපේක්ෂාවෙන් බුද්ධ වචනය ඒකරාශී කොට සජ්ඣායනා කිරීම ධර්ම සංගායනා නම් වේ.

01. පළමු ධර්ම සංගායනාව පැවැත්වීමට මූලිකත්වය ගත් මහ රහතන් වහන්සේ හා දායකත්වය දැක්වූ රජතුමා නම් කරන්න.

02. එම ධර්ම සංගායනාවෙන් ලැබුණු ප්‍රතිඵල තුනක් ලියන්න.

03. ගැටලු නිරාකරණය කර ගැනීමට සංගායනා ක්‍රමවේදය ඉවහල් කරගත හැකි අයුරු පෙන්වා දෙන්න.

(ලකුණු 2+3+5 = 10)

04.) 01. ''සුකරානි අසාධූනි . අත්තනො අහිතානි ච'' මෙම ගාථාව සම්පූර්ණ කර ලියන්න.

02. එම ගාථාවේ තේරුම ලියන්න.

03. තමාටත් අනුන්ටත් යහපත් වන ක්‍රියාවන් තුනක් විස්තර කරන්න. (ලකුණු 2+3+5 = 10)

05.) 01. බුදුරජාණන් වහන්සේ පළමු ධර්ම දේශනාව සිදුකළ පොහොය දිනය හා ස්ථානය පිළිවෙළින් නම් කරන්න.

02. සිව්සස් දහම්වලින් තුනක් ලියා දක්වන්න.

03. අසීමිත ආසාවන් පසුපස යාමෙන් මිනිසා දුකට පත්වන ආකාරය පෙන්වා දෙන්න.

(ලකුණු 2+3+5 = 10)

06.) 01. සිදුහත් බෝසතාණන් වහන්සේ දාන පාරමී හා දාන පරමත්ථ පාරමිතාව පිරූ ආකාරය ප්‍රකට වන ජාතක කතා දෙකක් නම් කරන්න.

02. පාරමිතා ගුණ ධර්ම පුහුණු කරන්නෙක් අත්හළ යුතු කරුණු තුන මොනවා ද?

03. සාර්ථක ජයග්‍රහණයන් සඳහා ස්ථිර අධිෂ්ඨානයෙන් හා වීර්යයෙන් කටයුතු කිරීම පාසල් ජීවිතයේ දී ඔබට වැදගත් වන අයුරු පෙන්වා දෙන්න.

(ලකුණු 2+3+5 = 10)

07.) පහත සඳහන් මාතෘකා අතුරින් දෙකකට කෙටි සටහන් ලියන්න.

01. දුටුගැමුණු රජතුමා

02. සඟකඩපහණ

03. උට්ඨාන සම්පදා

04. ත්‍රිලක්ෂණය

(ලකුණු 5x2 = 10)

Learning Resource Center
R
De Mazenod College
Kandana